නාඋල ප්‍රාදේශීය සභාව
මාතලේ දිස්ත්‍රික්කය
-------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 28 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට නාඋල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

(අ) ආයුර්වේද දෙපාර්තමේන්තු ප්‍රතිපාදන මගින් ලබාදී තිබූ රු.320,000ක් වටිනා ආයුර්වේද ද්‍රව්‍ය ආධාර වෙනත් ආධාර යටතේ ගිණුම්ගත කර නොතිබූ අතර ආයුර්වේද බෙහෙත් ද්‍රව්‍ය තොග ලැබීම් හා නිකුත් කිරීම් තොග ගිණුමට සටහන්කර නොතිබීම නිසා රු.121,583 ක් වටිනා ආයුර්වේද තොගය ඉතිරි තොගය ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) ඉඩම් හා ගොඩනැඟිලි ශේෂය තුල වූ භෞතික පැවැත්මක් නොතිබූ රු. 86,500 ක් වටිනා ප්‍රජාශාලාවක් රු.100,000 වටිනා ගම්සභා කාර්යාල ගොඩනැඟිල්ලක් හා රු.60,000 ක් වටිනා ඇලහැර පාරේ කඩ කිහිපයක් ගිණුම්වල දැක්වීමෙන් ඉඩම් ගොඩනැඟිලි ශේෂය රු.246,500 ක් වැඩියෙන් දැක්වුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්
---------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ගිණුම්වල අගය රු.85,419,358 ක් වූ අතර, ප්‍රාග්ධනයට ආදායමෙන් දායකවීමේ ගිණුම රු.86,888,319 ක් වූයෙන් එම ගිණුම් අතර, රු.1,468,961 ක වෙනසක් පැවතුණි.

1.3.3 ලැබිය යුතු ගිණුම්
-------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 9 ක වටිනාකම රු.17,499,735ක් වූ අතර, ඉන් වර්ෂ 3කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකර පවතින එකතුව රු. 543,255ක් වූ ශේෂ 3 ක් ඊට ඇතුළත් වී තිබුණි.

1.3.4 ගෙවියයුතු ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවියයුතු ණයහිමි ශේෂය රු.8,409,191 ක් වූ අතර, ඉන් වසරකට වැඩි කාලයක් නිරවුල් නොකර පවතින රු. 2,810,238 ක් වූ ශේෂ ඊට ඇතුළත්ව තිබුණි.

1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම.

--------------------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ගිණුම් විෂයයන් 4 කට අදාල එකතුව රු.29,997,396 ක්වූ ශේෂ විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.6 නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.

----------------------------------------------------

නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව | |
| (i) 29 රීතිය | අවස්ථා 13 කදී ඊ ණුන පියස මධ්‍යස්ථානයේ රැස්වූ රු.51,307 ක ආදායම් දින 9 සිට දින 74 ක කාලයක් අත රඳවාගෙන තිබුණි. |
| (ii) 180 රීතිය | ඊ ණුන පියස භාරව කටයුතු කරන නිලධාරිනිය විසින් මධ්‍යස්ථානයේ ආදායම් රැස්කිරීම හා ඒ සඳහා කුවිතාන්සි නිකුත් කිරීම සිදුකරන නමුත්, 2017 මාර්තු වන විටත්, ඇප තබා නොතිබුණි. |
| (iii) 217 රීතිය | ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ ලේඛනයක් යාවත්කාලීනකර නඩත්තු කර නොතිබුණි. |
| (iv)218 රීතිය | ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව වාර්ෂිකව සමීක්ෂණය කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ viii පරිච්ඡේදයේ 10:1(අ) වගන්තිය. | අවස්ථා 7 කට අදාලව වැඩ කළ කාලය, පැමිණීම සහ පිටවීම සහතික කර නොතිබියදී නිවාඩු දින වැටුප් රු.25,135 ක් ගෙවීම්කර තිබුණි. |
| (ඇ) මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ අංක 2016/03 හා 2016 මාර්තු 17 දිනැති චක්‍රලේඛය | තක්සේරුව අනුව මාසික කුලිය අය නොකර 2013 මැයි 30 දිනැති සභා තීරණය මත පදනම්ව කඩ කාමර 36 කින් රු.2,000 බැගින් කඩකුලී අයකරමින් පැවතුණි. |

2. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,901,185 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,465,634 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.9,435,551 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
-------------------------------------

(අ) මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය සඳහා ආදායම් ප්‍රභවයන් 3ක රු.9,150,170ක ආදායම් වැඩිවීම හා වියදම් විෂයයක රු. 789,394ක වියදම අඩුවීම විශේෂයෙන් බලපා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල රු.27,708,049ක මුළු පුනරාවර්තන වියදමින් රු.22,346,109ක මුදලක් එනම්, සියයට 81 ක් පෞද්ගලික පඩිනඩි සඳහා දරා තිබුණි.

2.3 ආදායම් පරිපාලනය
-----------------------

2.3.1 වරිපනම්
----------

(අ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හිඟහිටි වරිපනම් බදු ශේෂය රු.1,096,470 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් වූ රු.1,655,539 න් රු.699,583ක් එනම් සියයට 42 ක් හිඟව පැවතුණි.

(ආ) ප්‍රාදේශීය සභා රීති 32 ප්‍රකාරව වරිපනම් බදු ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

(ඇ) 2008 වර්ෂයෙන් පසුව වරිපනම් බදු සංශෝධනයක් සිදුකර නොතිබුණි.

(ඈ) රජයේ ආයතන 8 කින් සමාලෝචිත වර්ෂය අවසානයට අයවියයුතු රු.159,456 ක වරිපනම් වසර 2 සිට වසර 8½ දක්වා කාලයක් පුරා අය නොවී පැවතුණි.

2.3.2 කඩ කුලී
----------

කඩ කාමර සංකීර්ණ 6 ක කඩ කාමර 48 ක හිඟ හිටි කඩ කුලී ශේෂය රු. 367,425 ක් වූ අතර, එම ශේෂය තුල කඩ කාමර 5 කට අදාලව 2013 වර්ෂයේ සිට අයවියයුතුව පවතින රු.180,420 ක හිඟ කඩකුලී ශේෂයක්ද විය.

2.3.3 වෙනත් ආදායම්
------------------

(අ) අක්කර බදු
--------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු. 23,685 ක් වූ හිඟ හිටි අක්කර බදු ශේෂය වර්ෂ 7 ක කාලයක සිට නොවෙනස්ව ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ආ) ජල ගාස්තු
-------------

වර්ෂය ආරම්භයට පැවැති රු. 236,707 ක් වූ හිඟ ජල ගාස්තු වලින් රු.130,988 ක් එනම්, සියයට 55 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුලදී අයකරගෙන තිබූ අතර, සමාලෝචිත රු.199,085 ක හිඟ ජල ගාස්තු ආදායමක් පැවතුණි.

(ඇ) කසල බදු

-----------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.19,613 ක් වූ හිඟ හිටි කසල ගාස්තු ශේෂය වර්ෂ 6 ක කාලයක සිට නොවෙනස්ව ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ඈ) දැන්වීම් පුවරු ගාස්තු

------------------------

ප්‍රචාරක දැන්වීම් පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර, දැන්වීම් පුවරු ප්‍රදර්ශනය සඳහා අනුමැතිය ලබාදීමට විධිමත් කමිටුවක් පත්කර නොතිබුණි.දැන්වීම් පුවරු ගාස්තු අයවීම් පිළිබඳ ලේඛනයක්ද නඩත්තු කර නොතිබුණි.

2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වශයෙන් රු.1,817,363 ක මුදලක් සහ මුද්දර ගාස්තු වශයෙන් රු.5,629,437 ක මුදලක් අයවියයුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්ය සාධනය

------------------

රු.40,609,233 ක් වූ මුළු පුනරාවර්තන ආදායමෙන්, සභාවේ ස්වයං උත්පාදිත ආදායම රු.10,261,021 ක් වීම නිසා ස්වයං උත්පාදිත ආදායම මුළු පුනරාවර්තන ආදායමින් සියයට 25 ක් තරම් පහළ මට්ටමක පැවතුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ තනතුරු 06 ක පුරප්පාඩු 14ක් සහ එක් තනතුරක අතිරික්තතාවයක් පැවති අතර, පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1999 ජනවාරි 23 දින අනතුරකට භාජනය වී තිබූ අංක 252-6567 දරන ඩබල් කැබ් රථයේ අළුත්වැඩියාව සඳහා වැය වූ මුදලින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ප්‍රතිපූර්ණය නොවූ රු.152,200ක් මුදල වගකිවයුතු පාර්ශ්වයන්ගෙන් අයකර ගැනීමට හෝ සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු නොකර ලැබියයුතු ශේෂයක් වශයෙන් දිගින් දිගටම ගිණුම්වල දක්වා තිබුණි.

(ඇ) ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 4 දෙනෙකුගේ රු.19,931 ක් වූ සේවක ඇප ලියවිලි අළුත් ආයතනයට යැවීමට කටයුතු නොකර සභාවේ ඇප තැන්පතු වශයෙන් දක්වා තිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ගොඩනැගිලි අයදුම්පත් 50 ක් සඳහා අනුමැතිය ලබාදී තිබූ නමුත්, අනුකූලතා සහතික නිකුත්කර තිබුණේ අයදුම්පත් 8 ක් සඳහා පමණි.

(ආ) සංවර්ධන බලපත්‍ර ලබාගෙන ඇති නමුත්, අනුකූලතා සහතික නොමැතිව පදිංචිවීම් සම්බන්ධව ස්ථාන 10 කින් අයවියයුතු රු.158,650 ක ගාස්තු 2017 ජනවාරි 23 වන විට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභා කාර්යාල ගොඩනැගිල්ලේ 2015 වර්ෂයේ සිට පවත්වාගෙන යනු ලබන ඊ - නැණ පියස මධ්‍යස්ථානයේ පාඨමාලා සඳහා ප්‍රමාණවත් සිසුන් සංඛ්‍යාවක් ඇතුළත් කර ගැනීමට පියවරගෙන නොතිබූ අතර එහි ආදායම් සඳහා කුවිතාන්සි නිකුත් කිරීම ඇතුළු ආදායම් රැස්කිරීම සභාවේ වගකිවයුතු නිලධාරියෙකුගේ අධීක්ෂණයට ලක්ව නොතිබුණි.

(ඈ) උප පත්‍රිකා ලැබීම් සම්බන්ධව ප්‍රාදේශීය සභා ( මුල්‍ය හා පරිපාලන) රීති 17 අනුව ප්‍රා. ස. 21 පරිදි ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

3.4. නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්
-----------------------------------------
පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) අංක 77- 8931 දරන අත් ට්‍රැක්ටරය 2011 වර්ෂයේ සිටද, අබලන් වී තිබූ රු.135,000 ක් වටිනා වතුර බවුසරයක් 2010 වර්ෂයේ සිටද නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) 2015 පෙබරවාරි 6 දින පළාත් පාලන ආයතනවල නඩත්තු ඒකක සඳහා අවශ්‍ය මූලික යන්ත්‍ර සූත්‍ර බෙදාදීම වැඩසටහන යටතේ සභාව වෙත ලබාදී තිබූ රු.7,967,144ක් වටිනාකමින් යුතු මාර්ග තලනය 2016 වර්ෂයේදී අභාවිතව පැවතුණි.

(ඇ) නාඋල සතිපොල කඩ කාමර 6 ක් නිෂ්ක්‍රීයව පැවතුණු අතර, ඉන් කඩ කාමර 4 ක් 2013 වර්ෂයේ සිට මුද්‍රා තබා තිබුණි. අබලන් තත්ත්වයට පත්වෙමින් පැවති මෙම කඩ කාමර නැවත බදු දී භාවිතයට ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් දැනට ගිවිසුම්ගතව ඇති කඩ කුලී ප්‍රමාණය වූ මාසිකව රු.2,000 බැගින් වර්ෂ 4 ක් සඳහා රු.384,000 ක පමණ කුලී ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

(ඈ) මධ්‍යම පළාත් වෙළඳ, වානිජ හා සංචාරක දෙපාර්තමේන්තු ප්‍රතිපාදන මත රු.2,452,591ක් වැයකර සභාවට පවරානොගත් භූමියක 2015 නොවැම්බර් වනවිට ඉදිකර තිබූ ඓතිහාසික නාලන්දා ගෙඩිගේ ආශ්‍රිත සංචාරක පහසුකම් මධ්‍යස්ථානය 2017 මැයි 23 දින වන විටත්, විවෘත කිරීමට කටයුතු නොකර කිසිදු නඩත්තුවකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

3.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
---------------------------------

(අ) දිනකට එක්රැස්වන කසල මෙට්‍රික් ටොන් 1½ ත්, 2ත් අතර ප්‍රමාණයක් 2017 මැයි 30 දින වන විටත් සභාවට පවරාගෙන නොතිබූ සේරුදණ්ඩාපොල ඉඩමට බැහැර කරනු ලබන අතර භෞතික පරීක්ෂාවේදී වර්ගීකරණයකින් තොරව අවිධිමත්ව කසල තැන තැන ගොඩ ගසා තිබුණි. ඉඩම වටා ආරක්ෂිත වැටක් ඉදිකර නොතිබූ අතර, මෙම පරිශ්‍රය තුලට පෞද්ගලික ආයතනයකින්ද කසල බැහැර කර තිබුණි.

(ආ) කසළ බැහැර කරන ඉඩමෙහි 2006 වර්ෂයේදී රු.1,050,000 වැයකර ඉදිකර තිබූ කසළ වෙන්කිරීමේ ගොඩනැගිල්ල 2017 මැයි 30 දින දක්වාම කිසිදු ප්‍රයෝජනයකට නොගෙන අභාවිතව පැවතුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය
------------------------

අභ්‍යන්තර විගණනය සඳහා නිලධාරිනියක් පත්කර තිබුණු නමුත්, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුවී නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුල අභ්‍යන්තර විගණන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

4.2 විගණන හා කළමනාකරණ කමිටු

---------------------------------------

සමාලෝචිත වර්ෂය තුල විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි.

4.3 අයවැය පාලනය

--------------------

සමාලෝචිත වර්ෂය තුලදී අයවැය ලේඛනය සංශෝධනය කිරීමෙන් අනතුරුවද, අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බැවින් වැය විෂයයන් 14ක ශුද්ධ ප්‍රතිපාදනය සහ තථ්‍ය වියදම අතර සියයට 36 සිට සියයට 97 දක්වා පරාසයක විචලනයක් පැවතුණි.

5. පද්ධති හා පාලනය

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ආදායම් රැස්කිරීම.
(ආ) කාර්ය මණ්ඩල කළමනාකරණය.
(ඇ) වත්කම් කළමනාකරණය.
(ඈ) අයවැය පාලනය.